**දඹුල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දඹුල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීගිරි රථ වාහන නැවතුම් ස්ථානයේ ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු රු.575,864 ක කුළී, සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සීගිරි රථවාහන නැවතුමේ වෙළඳ අයිතිය බදුදීම සඳහා ගාස්තු බිල්කළ ආදායම රු.1,152,500 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | මෝටර් ග්‍රේඩරය, බැකෝ යන්ත්‍රය කුලියට දීමේ ආදායම් රු.465,305 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු රු.256,110 ක හිඟ වැටුප් ප්‍රතිපූර්ණ මුදල ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | බැංකුවට සෘජුව ලැබී තිබුණු ප්‍රේෂණ හා ගාස්තු ගැලපීමෙන් සංශෝධිත මුදල් පොත අනුව බැංකු ශේෂය රු.21,800,483 ක් වුවද එය රු.18,942,945 ක් ලෙස ශේෂ පත්‍රයේ දැක්වීම හේතුවෙන් බැංකු ශේෂය රු.2,857,638 කින් අඩුවෙන් දක්වා තිබුණි | -එම- | -එම- |
| (ඊ) | පොදු කටයුතු සඳහා වෙන්කර ඇති රු.2,500,000 ක රූඩ් 01 පර්චස් 29 කින් සමන්විත ඉඩම් කොටස ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| ( උ) සමාලෝචිත වර්ෂයට අදාළ බිල් කළ මුද්දර ගාස්තු ආදායම රු.677,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දි ඇති වරද පිළිගන්නා බව. | හිඟ ආදායම් සියල්ල ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයන් 27 ක, මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා අනුරූපි වාර්තා වල සඳහන් ශේෂයන් සමග සැසදීමේදී රු.52,573,515 ක නොසැසදීමක් විය. | ඉදිරියේදී එම වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය. |

**1.6.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂ වලදී හිඟ ආදායම් ලෙස හඳුනාගත් සංචාර හෝටල් බලපත්‍ර ගාස්තු රු.3,652,076 ක් නිසි අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේදි නැවත ආදායමට ගෙන නිවැරදි ක්‍රියාමාර්ග ගැනිමෙන් අනතුරුව කපාහැරිමට කටයුතු කරන බව. | නිසි අනුමැතියක් ලබාගැනිමෙන් පසු හිඟ ආදායම් කපාහැරිමට කටයුතු කළ යුතුය. |

**1.6.4 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිනිශ්චිත ගබඩා ගිණුමේ රු.411,946 ක හර ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරන බව | ශේෂය හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

**1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.150,517,858 ක ගිණුම් ශේෂ 04 කට අදාළ උපලේඛන සහ ශේෂ සනාථ ලිපි ඉදිරිපත් නොකිරිම නිසා විගණනයේදි සතුටුදායක ලෙස පරික්ෂා කල නොහැකි විය. | ලේඛන නිවැරදි කිරීමේ කටයුතු කරන බව | ගිණුම් ශේෂයන් සඳහා ලේඛන හා උපලේඛන පිළියෙල කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | ඉකුත් වර්ෂ වල ආදායම් ලෙස හඳුනාගත යුතු රු.1,108,150 ක වෙනත් තැම්පතු ශේෂ 05 ක් නියාදනය කර නොතිබුණි. | 2023 ගිණුම සකස් කිරීමේදී සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරන වාහන 03 ක් හා ට්‍රැක්ටර් ටේලර් 02 ක අයිතිය පවරාගැනිමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනිමට කටයුතු කරමින් පවතින බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2(අ) ඡේදය | ධාවනය කල නොහැකි තත්වයේ පවතින වාහන 02 ක් අපහරණය කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,101,567 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු18,118,670 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 2,501,100 | 165,890 | 165,890 | - | 2,501,100 | - | - | - |
| (ii). කුලී | 29,665,000 | 3,099,407 | 2,996,617 | 1,687,293 | 22,680,000 | 1,125,320 | 1,125,320 | 1,584,503 |
| (iii). බලපත්‍ර ගාස්තු | 23,699,200 | 10,359,585 | 9,280,683 | 1,419,294 | 34,289,000 | 10,583,029 | 5,574,694 | 7,309,271 |
| (iv). උසාවි දඩ | 13,753,500 | 10,592,041 | 8,515,941 | 2,076,100 | 14,030,500 | 8,650,550 | 4,440,050 | 4,210,500 |
| (v). මුද්දර ගාස්තු | 14,255,038 | 9,242,760 | 7,014,260 | 7,426,730 | 7,542,578 | 8,709,000 | 8,709,000 | 21,455,700 |
| (vi). වෙනත් ආදායම් | 14,255,038 | 7,184,668 | 6,635,468 | 1,071,700 | 29,075,130 | 1,103,000 | 790,000 | 660,500 |
| එකතුව | 98,128,876 | 40,644,351 | 34,608,859 | 13,681,117 | 110,118,308 | 30,170,899 | 20,639,064 | 35,220,474 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **බලපත්‍ර ගාස්තු** | | |
| සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 07 ක වසර 1 සිට වසර 04 ක කාලය තුල ගිණුම් ලබාගෙන බලපත්‍ර ගාස්තු අය කිරිමට කටයුතු කර නොතිබුණි. | ආයතන සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සිදුකරන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 අප්‍රේල් 13 දින ප්‍රාදේශීය සභාවේ කැබ් රථයක් අනතුරට ලක්වීමට අදාළ නිකුත් කළ මු.රෙ. 104(4) පරික්ෂණ වාර්තාවට අනුව සභාපතිවරයාට රු.2,367,534 ක් හා රියදුරුට රු.789,178 ක අලාභ අයකිරීමට නිර්දේශ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට අලාභය අයකර ගෙන නොතිබුණි. අනතුර හේතුවෙන් රු.2,474,868 ක අමතර | එම අලාභය අයකරගැනීම සඳහා දඹුල්ල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත් පරික්ෂණයක් සිදුකර එමඟින් ලැබෙන තීරණය අනුව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි පරික්ෂණ වාර්තා අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිරිවැයක් දරා තිබුණද එ් සම්බන්ධවද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | 2016 වර්ෂයේ සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ රු.461,654 ක ඌණ භාණ්ඩ සම්බන්ධයෙන් 2022 සැප්තැම්බර් 09 දින පළාත් පාලන කොමසාරිස් විසින් නැවත මු.රෙ. 104(4) පරීක්ෂණයක් සිදුකරන ලෙස දක්වා තිබුණද 2023 ජනවාරි 13 දින වන විටද එම පරීක්ෂණය සිදුකර නොතිබුණි. | නිලධාරීන් දෙදෙනෙකු සමීක්ෂණයක් ඉල්ලා ඇති බවත් එම සමීක්ෂණය මෙතෙක් සිදුකර නොමැති බව හා විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් තිදෙනාගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට සහකාර කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර තිබුණු ප්‍රජා ශාලා 12 ක ගොඩනැගිලි වටිනාකම සහ ඉඩම් 04 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව | තක්සේරුගත අගයන් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වසර 5 ට වැඩි ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.5,019,988 ක් විය. | හිඟ හිටි වෙනත් ආදායම් පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි බවත් දඹුල්ල මහා නගර සභාවෙන් ලැබිය යුතු මුදල් සම්බන්ධව මහා නගර සභාවට දන්වා යවා ඇති අතර ජංගම ගිණුමේ ශේෂය කඩිනමින් නිවැරදි කරන බව | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකිරිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව පරිහරණය කරනු ලබන සුසාන භූමි 16 ක් හා ඉඩම් 05 ක අයිතිය සභාවට පවරාගැනිමට කටයුතු කර නොතිබුණි. | සුසාන භූමි 16 ක් හා ඉඩම් 05 ක අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා දීමේ එකඟතාව පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි මඟින් දැනුම්දී ඇති බව | අයිතිය පවරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ප්‍රාදේශීය සභාවේ මෝටර් ග්‍රේඩරයේ ක්‍රියාකාරිත්වයේ පැවතියදි අපේගම සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කල ව්‍යාපෘති 04 ක් සඳහා පෞද්ගලික ආයතනයක් වෙතින් මෝටර් ග්‍රේඩරයක් කුලියට ගෙන රු.545,500 ක් ගෙවීම් කර තිබුණි. | සභාවේ මෝටර් ග්‍රේඩරය එම අවස්ථාවේදි බාහිර පාර්ශවයකට කුලියට ලබාදී තිබීම හේතුවෙන් වෙනත් මෝටර් ග්‍රේඩරයක් කුලියට ලබාගැනිමට සිදුවූ බව | සභාවේ ඉදිකිරිම් සඳහා සභාවේ යන්ත්‍ර හා උපකරණ භාවිතයට ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අයදුම්පත් 396 කට ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර නිකුත් කර එම කාලය තුල අනුකූලතා සහතික 42 ක් තරම් අඩු ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. | ඉදිකිරීම් සොයා බැලීමට ගොනු තාක්ෂණ නිලධාරින් වෙත භාර දී ඇති බව හා අයදුම්කරුවන්ට ලිඛිතව දන්වා ඇති බව | අනුකූලතා සහතික නිකුත් කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාපතිවරයා පාවිච්චි කරනු ලබන කැබ් රථය අනතුරට පත් වී අළුත්වැඩියා කර 2022 මාර්තු 05 දින සිට භාවිතයට ගෙන තිබියදී 2022 මාර්තු හා අප්‍රේල් මාස සඳහා එකතුව රු.100,000 ක ප්‍රවාහන දිමනාව ලබාගෙන තිබුණි. | අඹතැන්න ප්‍රධාන ඉංජිනේරු මහතා විසින් අවස්ථා දෙකකදී දින 07 ක් හා දින 11 ක් පරීක්ෂණ ධාවනයක යොදවන ලෙස දන්වා තිබූ බැවින් පැයට කිලෝමීටර් 50 ක වේගයෙන් අදාල කාලය ධාවනය කළ අතර එම කාලයට අදාළව සභාපතිවරයා විසින් අංක PE-0390 දරන කැබ් රථය භාවිතා කර ඇති බව දන්වා ඇති බව | සභාපතිවරයාගේ රාජකාරි කටයුතු සඳහා රථය යොදාගත් බවට දෛනික ධාවන සටහන් අනුව තහවුරු වන බැවින් දීමනාව සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.44,473,000 ක ට්‍රැක්ටර් රථ 03 ක් වසර 01 සිට වසර 04 දක්වා කාලයක් තුළ ඌණ උපයෝජිතව පැවතුණි. | රියදුරු පුරප්පාඩු හේතුවෙන් ප්‍රයෝජනයට ගැනිමට නොහැකි වී ඇති බවත් එක් ට්‍රැක්ටර් රථයක් කඩුගන්නාව නගර සභාවට ලබාදිමට කටයුතු කරන බව | වාහන උපයෝජනය කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳිමේදී ද්විතික මට්ටමේ තනතුරු 04 කට අදාළ නිලධාරින් 06 දෙනෙකු පුරප්පාඩු, ප්‍රාථමික මට්ටමේ තනතුරු 08 කට අදාළව 12 දෙනෙකුගේ පුරප්පාඩු සහ සෞඛ්‍ය කම්කරු තනතුරට අදාළ නිලධාරීන් 03 දෙනෙකුගේ අතිරික්තයක් විය. | පුරප්පාඩු පිරවීමට ඉල්ලීම් කර ඇත. ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගෙන මේ වන විට කොන්ත්‍රාත් පදනම මත සෞඛ්‍ය කම්කරුවන් 06 දෙනෙකු බඳවා ගෙන ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
**තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව ප්‍රාදේශීය සභාව විසින් විධිමත් පරිදි තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | පුස්තකාල සංවර්ධනය කිරීම, සෞඛ්‍ය ආරක්ෂිත ජලමුද්‍රිත පහසුකම් ලබා දීම.(සනිපාරක්ෂක වැසිකිලි ඉදි කිරීම), මාර්ග සංවර්ධනය කිරීම යන අරමුණු වලට අදාළව ක්‍රියාකාරකම් සිදුකර ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |